**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**
**காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்**
**OFFICE ON MISSING PERSONS**

---

**මාධ්‍ය නිවේදනය** **2018 මැයි මස 22**

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මීළඟ රැස්වීම **ජූනි මස 2** වෙනි දින මුලතිවු දිස්ත්‍රික්කයේ දී පැවැත්වීමට සැලසුම් කර තිබේ. ජනතාව සමග මෙම සංවාද වැඩ පිලිවෙල මන්නාරම සහ මාතර යන දිස්ත්‍රික්ක මුල් කර ගනිමින් මැයි මාසයේ දී දියත් කරන ලදි. කොමසාරිස්වරු හත්දෙනාම අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයන්, අතුරුදහන් වූවන් පිළිබඳ කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන සහ ක්‍රියාකාරිකයින් මෙන්ම ජනමාධ්‍ය සමග ඉදිරි සැලසුම් සහ ක්‍රමවේදයන් පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමත් ඒ සම්බන්ධයෙන් ජනතා අදහස් විමසීමක් ද අපේක්ෂා කෙරේ.

මෙම රැස්වීම මුලතිවු දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයේ පැවැත්වේ. එදින වැඩ සටහන මෙසේය.

| | |
|---|---|
| පෙ. ව. 9.00 - 11.00 - | මුලතිවු දිස්ත්‍රික්කයේ පුදුකුඩිරිප්පු සහ මැරිටයිම් පත්තු යන කලාපවල අතුරුදහන් වූවන්ගේ සහ අතුරුදහන් කරවන ලද අයගේ පවුල් සමග සාකච්ඡාව |
| පෙ. ව. 11.00 - 1.30 - | මුලතිවු දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් සහ නැගෙනහිර මාන්තයි සහ වැලිඔය යන කලාපවල අතුරුදහන් වූවන්ගේ සහ අතුරුදහන් කරවන ලද අයගේ පවුල් සමග සාකච්ඡාව |
| ප. ව. 1.30 - 2.00 - | මාධ්‍යය හමුව |
| ප. ව. 2.30 - 4.00 - | සිවිල් සමාජ නියෝජිතයන් සමග සාකච්ඡාව |